# දැන්වීමයි

## සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## යෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවීම

### විශ්වවිද්‍යාල ප්‍රවේශය - 2020/ 2021 අධ්‍යයන වර්ෂය

### දෘශ්‍ය කලාවේදී/ ප්‍රාසංගික කලාවේදී (සංගීත / නර්තන/ නාට්‍ය හා රංග කලාව)

### ගෞරව උපාධි පාඨමාලා

### (2020 අපොස (උ. පෙළ) ප්‍රතිඵල මත)

2020/ 2021 අධ්‍යයන වර්ෂය වෙනුවෙන් සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයට සිසුන් ඇතුළත් කර ගැනීමේ යෝග්‍යතා පරීක්ෂණය සඳහා 2020 වර්ෂයේ පැවති අ.පො.ස (උසස් පෙළ) විභාගයේදී පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා ඇති බවට නිවේදනය කර ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. ප්‍රවේශය සඳහා අවශ්‍ය අවම සුදුසුකම්

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති "ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල, ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය, අධ්‍යයන වර්ෂය 2020/ 2021 (අ.පො.ස (උසස් පෙළ) විභාගය 2020)" ශිෂ්‍ය අත්පොතේ 1 කොටසේ 1.2 ඡේදය යටතේ ඇති විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් සපුරා ඇති **සහ**

චිත්‍ර හා මූර්ති කලා/ සංගීතය/ නර්තනය / නාට්‍ය හා රංග කලාව යන විෂයයන්ගෙන් හැදෑරීමට බලාපොරොත්තු වන අධ්‍යයන පාඨමාලාවට අදාළ විෂයට 2020 අ.පො.ස (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් සහිතව පෙනී සිටි විෂයයන් තුනෙන්ම සමත්ව සිටීම.

(ii) විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අවශ්‍ය ඉහත කී අවම සුදුසුකම් ඇති සිසුන් ඊට අමතරව සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල ප්‍රවේශය ලැබීම සඳහා විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන **යෝග්‍යතා පරීක්ෂණයෙන් ද** සමත්විය යුතුය.

02 අයදුම් කළ යුතු ආකාරය

අයදුම්කරුවන් සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ නිල වෙබ් අඩවිය වන **www.vpa.ac.lk** හි ඇති අයදුම්පත මාර්ගගත ක්‍රමයට (Online) සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය.

අයදුම් කළ හැකි අවසන් දිනය 2021.06.30 වේ.

යෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටින අයදුම්කරුවන්ගෙන් එක් පාඨමාලාවක් සඳහා රු. 2,000/= ක ගාස්තුවක් අය කරනු ලැබේ. එම මුදල සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය නමින් ලංකා බැංකුවේ නිදහස් චතුරශ්‍ර ශාඛාවේ ඇති අංක 84072227 දරන ගිණුමට බැර වන පරිදි ලංකාවේ ඕනෑම ලංකා බැංකුවකට මුදල් ගෙවා ලබාගන්නා ලද ගෙවීම් වවුචරය හෝ විශ්වවිද්‍යාල වෙබ් අඩවිය www.vpa.ac.lk හි Pay Online හරහා ගෙවීම් කර ලදුපත ලබාගත යුතුය.

අ.පො.ස. (උ. පෙළ) සෞන්දර්ය විෂයයන් දෙකක් සඳහා පෙනී සිට එම විෂයන් දෙකෙන්ම යෝග්‍යතා පරීක්ෂණය සඳහා පෙනී සිටීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් වෙන වෙනම එම පාඨමාලා සඳහා ප්‍රායෝගික පරීක්ෂණ ගාස්තු ගෙවීම සහ අයදුම්පත් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

මාර්ගගත ක්‍රමයට (online) අයදුම්පත සම්පූර්ණ කිරීමට ප්‍රථම පහත ලේඛන සූදානම් කරගත යුතුය. ගිණුමට මුදල් බැරකර ලබාගන්නා ලද ගෙවීම් වවුචරයේ පැහැදිලි ඡායාරූපයක් (Image) ජාතික හැඳුනුම්පතෙහි දෙපසෙහි පැහැදිලි ඡායාරූපයක් (Image) මාස හයක් (06) ඇතුළත ලබාගත් පැහැදිලි උඩුකය ඡායාරූපයක් (Image) සහ 2020 අ.පො.ස. උසස් පෙළ ප්‍රතිඵල ලේඛනයේ පැහැදිලි ඡායාරූපයක් (Image) අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන මෙම ඡායාරූප (Image) වලට අදාළ ලේඛනවල මුල් පිටපත් විශ්වවිද්‍යාලය විසින් යම් අවස්ථාවක ඉදිරිපත් කරන ලෙස දන්වුවහොත් ඉදිරිපත් කිරීමට සුරක්ෂිතව තබාගත යුතුය.

3. **විශ්වවිද්‍යාල ප්‍රවේශයට අවශ්‍ය අවම සුදුසුකම් සපුරා නොමැති අයවලුන්ගේ අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් මෙන්ම අයදුම් කළ හැකි අවසන් දිනට නොලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එවැනි අවස්ථාවක දී අයදුම්කරුවන් විසින් ගෙවා ඇති ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.**

5. **සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා යෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටින සියලුම අයවලුන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත අයදුම් කර තිබිය යුතුය.**

6. මෙම යෝග්‍යතා පරීක්ෂණය මාර්ගගත ක්‍රමයට (Online) පැවැත්වෙන අතර පරීක්ෂණයට අදාළ විස්තර සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගේ ජංගම දුරකථනයට කෙටි පණිවිඩයක් ලෙස සහ ඔවුන්ගේ විද්‍යුත් තැපැල (e-mail) වෙත පමණක් දන්වනු ලබන අතර, තැපැල් මගින් දන්වනු නොලැබේ. මෙම යෝග්‍යතා පරීක්ෂණය සිංහල මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.

**ලේඛකාධිකාරී, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය,**
**21, ඇල්බට් චන්ද්‍රවංකය,**
**කොළඹ 07.**

දු.ක.අ. 011-2033710
2021.06.09